**රජගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රජගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.3,401,225 ක වෙනසක් පැවතුණි. | නිවැරදි ප්‍රමාණයෙන් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ඉඩම් හා ගොඩනැගිලි 26 ක, ට්‍රැක්ටර් රථ 02 ක හා ට්‍රේලර් රථ 02 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සභාව සතු වත්කම් තක්සේරු කර, ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | හික්කඩුව නගර සභාවට අයත්ව තිබුණු රු.5,760,007 ක් වූ ආදාහනාගාරය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉවත් කිරීම් කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | කාර්යාලයේ ආරක්ෂක කුටිය ඉදිකිරීමට සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබූ රු.62,499 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | ජංගම පුස්තකාලයේ තිබූ වටිනාකම රු.826,776 ක් වූ පොත් 4,044 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | හැගොඩ සිට මුදලිගොඩ මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන රු.798,582 ක් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.13,893,213 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන ඇති කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,124,802 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ රු.288,833 ක් වූ හර ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද, අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ගිණුම් ශේෂය නිරවුල් කළ යුතුය. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) **ලැබිය යුතු ගිණුම්**<br>වර්ෂ 07 සිට වර්ෂ 17 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.10,633,868 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් හඳුනාගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) **ගෙවිය යුතු ගිණුම්**<br>වර්ෂ 12 සිට වර්ෂ 17 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,201,260 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂයන් නිරවුල් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.263,814,610 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------

| | | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **වටිනාකම** රු. | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|---|---|
| (අ) | | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| | (i) | මු.රෙ. 156 | 25,222 | සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනට නොගෙවීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේ පනවා තිබූ අධිභාර මුදල අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) | මු.රෙ. 570 හා 571(1)(2) | 923,928 | කාලය ඉකුත් වූ පොදු තැන්පත් ශේෂ 50 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,134,492 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,611,431 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,831,000 | 1,161,836 | 884,608 | 6,526,942 | 1,378,294 | 1,235,812 | 1,601,703 | 6,254,864 |
| කුලී | 1,602,500 | 105,600 | 116,620 | 658,034 | 1,395,677 | 105,600 | 110,590 | 669,054 |
| බලපත්‍ර ගාස්තු | 910,500 | 632,354 | 632,354 | 81,622 | 666,784 | 675,587 | 675,587 | 81,622 |
| | 4,344,000 | 1,899,790 | 1,633,582 | 7,266,598 | 3,440,755 | 2,016,999 | 2,387,880 | 7,005,540 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.7,005,540 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,899,790 ක් විය. ඒ අනුව අයවිය යුතු මුළු ආදායම රු.8,905,330 ක් විය. වර්ෂයේ මුළු අයවීම් රු.1,633,582 ක් වීමෙන් ආදායම් අයවීම් සියයට 18 ක අඩු මට්ටමක පැවතුණි. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් බදු ආදායම රු.7.416,700 කින් අයකර ගැනීම් රු.884,608 ක් වීමෙන් ආදායම් අයවීම් සියයට 12 ක අඩු මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.8,850,610 ක වරිපනම් බදු හිඟ ශේෂයක් පවතින අතර, සමාලෝචිත වර්ෂයේදී ද, අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 කුලී ආදායම**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු කුලී ආදායම රු.774,654 කින් අයවීම් රු.116,620 ක් වීමෙන් අයවීම් ප්‍රතිශතය සියයට 15 ක් ව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.5,025,640 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.98,960,978 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

| | | |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්සකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

| | | |
| --- | --- | --- |
| මොන්රෝවියාවත්ත ඉඩමෙහි ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර ව්‍යාපෘතිය වසර 04 ක කාලයක සිට නවතා දමා තිබු අතර, ව්‍යාපෘතිය සඳහා ඉදිකල ගොඩනැගිලි 02 ක් හා කාබනික පොහොර නිෂ්පාදනයට යොදාගත් උපකරණ විගණිත දිනය වු 2019 පෙබරවාරි 26 දින දක්වා ම නිෂ්ක්‍රීයව පැවතුණි. | කසළ කළමනාකරණය සඳහා දීර්සකාලීන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වේ. | කසළ කළමනාකරණය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මෙහෙය වන ව්‍යාපෘතියට භාර දී ඇත. |

**(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

| | | |
|---|---|---|
| ජංගම පුස්තකාල සේවය සඳහා යොදවා තිබූ රු.3,348,276 ක් වටිනාකම වූ වාහන, පොත් හා උපකරණ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් යොදවා නොතිබුණි. | නැවත ව්‍යාපෘතිය ආරම්භ කළ යුතු වේ. | ඉදිරියේ දී නැවත ව්‍යාපෘතිය ආරම්භ කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 22 ක් බදු දීමේ දී ගිවිසුම් වලට එළඹ නොතිබුණි. මෙම කඩ කාමර අතරින් කඩ 16 කට අදාළව රු.535,150 ක කඩ බදු හිඟව තිබූ නමුත්, බදු ගිවිසුම් නොතිබීමෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට බාධාකාරී තත්ත්වයක් ඇති වී තිබුණි. | ගිවිසුම් ඇතිකර ගැනීමටත් හිඟ කඩ කුලී අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ගිවිසුම් ඇතිකර ගැනීමටත් කඩ කුලී අයකර ගැනීමටත් කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) පුරප්පාඩු පැවැති තනතුරු 02 ක් සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට ද අතිරික්ත තනතුරු 21 ක් විධිමත් කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) සභාවේ නිලධාරීන් 12 දෙනෙකු නිත්‍ය තනතුරට අදාළ නොවන ඉහළ තනතුරුවල රාජකාරි ආවරණය කරන බව නිරීක්ෂණය විය. | තනතුරට අදාළ රාජකාරි පැවරිය යුතු වේ. | බඳවා ගැනීමෙන් රාජකාරි නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **සේවක ණය**<br>--------------- | | |
| | සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා මිය ගිය සේවකයන් 06 දෙනෙකුගෙන් 2006 වර්ෂයේ සිට අයවිය යුතුව තිබෙන රු.26,760 ක් සහ 2016 වර්ෂයේ සේවයෙන් ඉවත්ව ගිය සේවකයකුගෙන් අයවිය යුතු රු.9,711 ක ශේෂයක් ද, අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයකර ගැනීමට බලාපොරොත්තු වෙමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

**පෙර පාසල් පාලනය**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඩෙල්මාර් ජනපදය තුළ පිහිටි පෙර පාසල 2012 වර්ෂයේ සිට වසා දමා තිබූ අතර, පෙර පාසල අළුත්වැඩියා කර යළිත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර පාසල අළුත්වැඩියා කර කඩිනමින් ආරම්භ කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ ප්‍රතිපාදන නොමැතිවීම නිසා 2020 වසරේ දී ආරම්භ කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වසාදමා තිබූ පෙර පාසලේ පාලිකාවකට කිසිදු රාජකාරියක් නොපවරා සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මස සිට 2019 වර්ෂයේ පෙබරවාරි දක්වා මාසිකව රු.35,284 ක් බැගින් එකතුව රු.141,136 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | පෙර පාසල විවෘත නොකරන්නේ නම් වෙනත් ආයතනයකට ස්ථාන මාරුවක් ලබා දිය යුතු වේ. | ස්ථාන මාරුව සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා-ට දන්වා ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.5.1 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දී රු.456,500 කට අස්වනු නෙලා ගැනීමේ කොන්දේසිය මත බදු දී තිබුණ කුරුඳු ඉඩම සමාලෝචිත වර්ෂයේ දී බදු දී නොතිබුණ අතර, වගාව නඩත්තු | වගාව නඩත්තු කර බදු දීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නඩත්තු කර අස්වනු නෙලා ගැනීමට කටයුතු කරමි. |

නොකර අත්හැර දමා තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රදේශ වල කුඩා මාර්ගවල ධාවනය කළහැකි ගලි බවුසරය අළුත්වැඩියා කර, ආදායම් උපයා ගැනීම සඳහා යොදා නොගෙන කාබනික පොහොර නිෂ්පාදන අංගන රථ ගාලේ ගාල් කර තිබුණි. | අළුත්වැඩියා කර, ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කරමි. |

### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර, ට්‍රැක්ටරයක්, කැබ් රථයක් ට්‍රේලරයක් හා සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට කොම්පෝස්ට් අංගනයේ රඳවා තිබුණි. | අළුත්වැඩියා කිරීමට නොහැකි නම් අපහරණය කළ යුතු වේ. | අපහරණය කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. |

### 3.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා රු.85,893 ක අධිභාරයක් පනවා තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(1) අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු දී නොමැත. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 03 ක රු.12,205,490 ක් වූ ඉතිරිවීම් වූ අතර, එම වටිනාකම් සියයට 33 සිට සියයට 65 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| | | තාත්වික ඇස්තමේන්තු | |

| | | | |
|---|---|---|---|
| (ආ) | වියදම් විෂයයන් 03 ක අහිතකර විචලනය රු.2,787,044 ක් වූ අතර, එම වටිනාකම සියයට 36 ත් සියයට 100 ත් අතර පරාසයක විය. | පිළියෙල කළයුතු වේ.<br><br>තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ඇ) | එක් ආදායම් විෂයයක අහිතකර විචලනය රු.11,631,549 ක් හෙවත් සියයට 78 ක් විය. | | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණු අතර,ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර, විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නීති ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමෙන් පසු නිලධාරියෙකු යොදවමි. |